# ඉතින් නිවුණා ද ළය ගිණි



"මට බය හිතුණා . . . මොකක්ද දන්නෑනෙ කරන්නෙ.. මං නාට්‍යයක රඟපාලත් නෑනේ'' ඒ හසිනි ඉලංගරත්න දැරිය. සවන් දෙමු අපි ඇයට.

''ඉස්සරවෙලාම කැමරාව ඉස්සරහට එනකොට රුක්මල් මාමායි හිටියෙ.. මම ෂෙහාන් මල්ලිත් එක්කයි රඟපෑවෙ.. එයා පට්ටෙ උඩ ඉඳගෙන.. මම ඇදගෙන යනවා.. ඉස්සරවෙලාම කරපු දර්ශනය හරියට ආවෙ නැහැ. දෙවෙනි දර්ශනයට එනකොට පොඩ්ඩක් හිතට හයිය ආවා. රුක්මල් මාමා තමයි වැරදි හරි ගැස්සුවෙ.''සහිනි චතුර ලෙස ඉංග්‍රීසියෙන් විස්තර කරන්නීය. එවකට ඇය සවැන්නේ දැරියකි.





මේ ටෙලි නාට්‍යයක ප්‍රධාන චරිතයක් සඳහා පණ පෙව් මෙල්බර්න් නවක ළමා නිළියකගේ මුල්ම අත්දැකීමයි.

''ශිරෝමි ඇන්ටි ලියලා දුන්න සිංහල වචන අම්මයි මායි සිංහලට හැරෙව්වා. ඉස්කෝලෙදි එහෙම රඟපාපු ඉංග්‍රීසි නාට්‍ය වගේ නෙවෙයි.. වෙනස්. හරිම අමාරුයි ඒව ට පිටාවට අනුගත වෙන්න. වැරදුණ ඒවා අයෙ කරනකොට ඊටත් අමාරුයි.''

''ඒක ශීත නිවාඩු කාලයක්. ඒ ඇඳුම් ඇඳගෙන දවසේ වැඩි තොටසක් ගත කරන්න වුණේ හරිම ආමාරුවෙන්. කැප කිරීම් කරන්න වුණා. මගේ උපන් දිනයේ පවා දර්ශන ගත කිරීම් කළා''

මෙරට සිට ලංකාවේ පිටිසර ගම්මානයක වෙසෙන දැරියකගේ චරිතය කදිමට මවා පෑ ළමා නිළියගේ කතාවේ සංක්ෂිප්තයයි ඒ. මල්ලියගේ චරිතය රඟ පෑ ෂෙහාන් ඩි මෙල් තවමත් සිය අත්දැකීම් විස්තර කිරීමට තරම් අවබෝධයක් නැති පළමුවන වසරේ දරුවෙකි. ෂෙහාන් ගේ සොයුරිය සඳුනි විසින්ද චරිතයක් නිරූපනය කරණු ලැබීය.

කුමක් සඳහා ද මේ.? ඒකාංගික ටෙලි නාට්‍යයක් සඳහායි. අප මෙසේ මුල පිරූයේ ''ඉතින් නිවුනා ද ළය ගිනි'' නම් ඒකාංගික ටෙලි නාට්‍යය පිළිබඳ කතිකාවකටයි.

කවුරුන්ද මේ ''ශිරෝමා ආන්ටි''? ඇය මෙල්බර්න් නුවර වාසී ශිරෝමා ප්‍රනාන්දු ගායන ශිල්පිණියයි. ඇයයි ටෙලි නාට්‍යයේ නිෂ්පාදක වරිය. තිර රචිකාවිය. ගීත රචනයෙන් ද ගායනයෙන් ද අනිත් ශිල්පීන් හා මුසු වන්නීය ඇය.

''මං මුලින්ම ස්තුතිවන්ත වෙන්න ඕනෙ මං විශ්වාස කරන දෙවියන් ට. උන් වහන්සේගේ ආශිර්වාදය නැතුව මට මේ කිසිම දෙයක් කරගන්න ලැබේවිය කියලා මං හිතන්නෙ නැහැ. '' ශිරෝමා ප්‍රනාන්දු නිෂ්පාදකවරිය ඇයගේ උත්සාහය පිළිබඳව මුමුණන්නට මුල පිරුවා ය.

''ශ්‍රී ලංකා කෙයාරර්ස් ඇසෝසියේෂන් කියලා අපි පිහිටුවා ගත්ත සංවිධානයෙන් කරපු 'සුරක්නා' විවිධ ප්‍රසංගයේදී දස්කම් දක්වපු දූලා පුතාලා දැකලා තමයි මට මේ අදහස ඇත්තටම ආවෙ. ලංකාවෙ අපි පදිංචි වෙලා හිටිය පිටිසර ගමක වුණ ඇත්ත සිද්ධියක් මගේ හිතේ කාවැදිලා තිබුණා. හසිනි දුව දික්තලාගේ චරිතය ප්‍රසංගයේ රඟපානවා දැක්කම මට හිතුණා අර ඇත්ත කලාවේ ළමා චරිතය හසිනිගෙන් ගන්න පුලුවන් නේද කියලා. මං ලාකාවට ගිය වෙලාවෙ රුවන් පුතාව අඳුනාගත්තා. 'නුඹ ළඟ මං' ගීත එකතුවේ ගීත දර්ශන ගත කරනකොට.'' රුවන් වික්‍රමසිංහ ලංකාවේ දක්ෂ හා ජනප්‍රිය ටෙලි නාට්‍ය රංගන ශිල්පියෙකි. ''ඉතින් රුවන් තමයි මට කිව්වෙ රුක්මල් පුතා මෙල්බර්න් වල ඉන්නවා. එයා මේ වැඩේට ගැලපෙනවා. අඳුනාගන්න.. කියලා''

රුක්මල් නිරෝෂ් ''සඳ අමාවකියි'' ''සුභ සිහින'' ''ධවල කන්‍යා'' ''හද විල සක්මණ'' ටෙලි නාට්‍ය සංස්කරණය සඳහා සිග්නිස් සම්මානය ද ලබා ගත් තරුණ ප්‍රවීණ ශිල්පියෙකි. රයිගම්. සුමති හා උන්ඩා සම්මාන වලින් ද පිදුම් ලැබීය ඔහු.

''රුවන් එයාට ගේන්න පුලුවන් දේවල් ගෙනාවා. මමත් මිරිස් ගල්. දියවුණ වට්ටි පැදුරු වගේ දේවල් අරගෙන ආවා. පොල් අතුත් ගෙනාවා. දර්ශන තලත් මගේ හිතේ ඇඳිලා තිබුණා. බෙරික් ශාක්‍ය මුණි සම්බුද්ධ විහාරස්ථානයේ අධිපති පූජ්‍ය ගරු විමාලානන්ද ස්වාමින් වහන්සේට ස්තුතිවන්ත වෙන්න ඕනෙ ඒ පරිසරයේ දර්ශන ගතකිරීම් කරන්න අවසර දුන්නට. ඒ වගේම කීස්බරෝ ධම්මසරණ විහාරස්ථානයාධිපති ගරු පූජ්‍ය නාඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේවත් මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනේ. ඇත්තටම පැලේ වරිච්චි බිත්ති හදන්න ගත්තේ බෙරික් පන්සලේ ධර්ම ශාලාව හදන්න කපපු මැටි. ලෙස්ටර් ෆීල්ඩ් වැවට එපිටින් තිබුණ කැලයත් හේන් පරිසරය තියෙන බිම් කොටසත් මගේ හිතේ ඇඳිලා තිබුණ ගමේ පරිසරයට හොඳීන් ගැලපුණා. ඇත්තටම මේ හැම දෙයක්ම කරන්න අවසර ගන්න වුණා.''

''ළමයි එක්ක කරපු වැඩක් නිසා ගොඩක් පරිස්සම් වෙන්න වුණා. ගිනිබත් කරන දර්ශනයක් ගන්න ඉඩ දුන්නෙ නැති නිසා ඒක කරන්න වුණේ ලංකාවේ.''

කලින් සඳහන් කළ දරුවන්ට අමතරව කසුන්. කාවින්ද. ජනනි මුණසිංහ සොහොයුරු සොහොයුරියන්. යසාධි. රසාධි හා දසුන් ඕපනායක සොයුරු සොයුරියන් මාලන් ගුණවර්ධන. දිලිනි ඉලපගරත්න. රජිත්‍රි හබරකඩ. නිලූ විජේතුංග . ෂැලෝම් විජේතුංග . යසිත් විදාන. හිමේෂා කුලතුංග හා නෙත්මි කුලතුංග යන දරු දැරියන් රංගනයෙන් දායක වූ අතර ගායනයෙන් සරිනි හා පියත් දිසානායක දරුවන් දායක වුණා.

රුවන් වික්‍රමසිංහගේ ප්‍රධාන වැඩිහිටි රංගනයට මුහු වූ රංගන ශිල්පිනිය වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රවීණ රංගන ශිල්පිණියක වූ ගයනි ගිසන්තිකා යි. ඇය කරළියෙහි පමණක් නොව සිනමාවේදී ද හසල දස්කම් පෑ ශිල්පිනියකි. වරෙක ඇය හොඳම සහාය රංගන ශිල්පිනිය ලෙසින් සම්මාන ලැබුවාය. සංගීත අධ්‍යක්ෂණයෙහි බර දැරුවේ ශ්‍රී ලංකාවේ සම්මානණීය ප්‍රවීණ සංගීතවේදියකු වන තරුපති මුණසිංහ යච්චනයායි. වේදිකා හා ටෙලිනාට්‍ය සංගීත අධ්‍යක්ෂණයට ය ඔහු සම්මාන ලැබුයේ.

''රංගනය සරළ දෙයක් නෙවෙයි. ඇත්තටම දුෂ්කර දෙයක්. මේක මට විශේෂ චරිතයක් වුණා'' ඒ ගයනි ගිසන්තිකා රංගන ශිල්පිනියයි. ''මෙහේ ඉපදුන දරුවන් හොඳින් රඟ පෑවා. ඒත් ඔවුන්ට භාෂාවේ නුපුරුදු කම පොඩි බාධාවක් වුණා කියලයි මට හිතේනනෙ. එයාලට නෙවෙයි අපටත් හුරු නැති ග්‍රාමීය වචනයි පිටපතේ තිබුණෙ. මේ දුෂ්කර පරිසරය මෙහෙ මවන්නෙ කොහොමද කියලා හිතාගන්න බැරි වුණා. ඒත් රුක්මාල් ගැන තිබුණ විශ්වාසයත් ශිරෝමාගේ උත්සාහයත් නිසා ඒ අතින් සාර්ථක වේවි කියලා හිතුනා''

''මම සඳ ලංකාව ප්‍රදේශයේ කෙනෙක්. ඉතින් ශිරෝමා බලාපොරොත්තු වූ දේ මට හොඳින් තේරුණා.'' ටෙලිනාට්‍යයේ කලා අධ්‍යක්ෂණය කළ සරත් රූපරත්නයි ඒ. වරිච්චි බිත්ති බැඳි ගෙපලක් නිර්මාණය කරගත් අන්දම විස්තර කරන්නට ඔහුට එක් වුණේ කලා අධ්‍යක්ෂණයට එක්වුනා වූ බණ්ඩාර ඉලංග රත්න මහතායි.

දූ දරුවන් කීප දෙනෙකුගේම මව් වරුන් වූ රේනුකා ද මෙල් සහ ශ්‍යාමා මුණසිංහ මහත්මීන් දර්ශන ගත කිරීම් කෙරුණා වූ සති දෙකක කාලය තුළ සිය දරුවන් සමඟින් ගෙන ගියා වූ 'සටන' පිළිබඳව සවිස්තරව කළ කතා ඉතා රසවත් විය. සැමවිටම දෙමාපියන් දුන් සහය සවියක්ම විය ශිරෝමාට.

''ඇත්තටම පිටරටක කලාය කියලා නමට කරන චිත්‍රපට ටෙලිනාට්‍ය වලට වඩා නම් සාර්ථකයි'' තරුපති මුණසිංහ සංගීත අධ්‍යක්ෂවරයාගේ අදහසයි ඒ. ''මට ඕනෙ කරන මගේ වාදකයන් භාණ්ඩ නොතිබුණ එක නම් ටිකක් දැනුණා. ලංකාවට යවලා කරන්න යන වියදම ගැනත් දෙපාරක් හිතන්න වුනා. මොන පරිසරයකද ඉන්නෙ කියන එක මට කිසිසේත්ම අදාල වුණේ නැහැ. ඒ වන්නි හත්පත්තුව පරිසරයට මට හිතෙන් ඒ මොහොතට යන්න පුළුවන් වුණ නිසා.''

''කැමරාකරණය කළේ බුද්ධික සේරසිංහ. ආම්පන්න සුමේධ ප්‍රනාන්දුගෙන්. ගීත රචනයෙන් මට සිසිර දිසානායකත් රවි සිරිවර්ධනත් ගායනයෙන් දූලා පුතාලාට අමතරව හේමන්ත ඩයස් මල්ලීත් එකතු වුණා. අපේ ස්වාමි පුරුෂයන්ගෙන් ලැබුණ සහයත් කියලා නිමකරන්න බැහැ. අපි හොඳ දෙයක් කළාය කියලා සැනසෙන්න පුලුවන්. ඒත් ඉතින් හැම දෙයක්ම බාර වෙන්නේ ප්‍රේක්ෂකයන්ටනේ.'' ශිරෝමා ප්‍රනාන්දු කතිකාවට නැවතුම තැබුවා ය.

*සාකච්ඡා කර ලිව්වේ*

**සිසිර දිසානායක**